## 1.26 වජ්‍රයානය : අභිචාරවිධි

ආචාර්ය කහපොළ සුගතරතන හිමි
සංස්කෘත අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

තන්ත්‍රයාන යන පොදු නමකින් හැඳින් වූවත් එය විවිධ ශාඛාවන්ගෙන් සමන්විත වූවකි. වජ්‍රයාන, සහජයාන, කාලචක්‍ර යාන යයි එහි ප්‍රධාන ශාඛා තුනකි. මේවායෙහි මූලික ඉගැන්වීම්හි සමානතා දක්නට ඇතත් අසමානතා ද දිස් වේ. උදාහරණයක් ලෙස වජ්‍රයානයෙහි බුද්ධත්වය හඳුන්වනුයේ වජ්‍රසත්ත්ව යනුවෙනි. විශේෂයෙන් ශූන්‍යතාව අළුතෙන් අර්ථකථනය කරන බව දක්නට ලැබේ. මේ ශාඛා පිළිබඳව වෙන් වෙන් වශයෙන් විමසීමෙන් ඒවායෙහි අන්තර්ගතය වටහා ගත හැකිය.

වේද කෘතින්හි ඉන්ද්‍රගේ වජ්‍රායුධය සුප්‍රසිද්ධය. අකුණු පහර ද (thunder bolt ) වජ්‍ර නමින් හැඳින්වේ. අථර්ව වේදයෙහි වජ්‍රය වාසනාව සතුට සශ්‍රීකත්වය සහ ආරක්‍ෂාව ගෙනදෙන මාණික්‍යයක් ලෙස ද සඳහන් වේ. වජ්‍රයේ හිංසාකාරී මෙන්ම සම්පත්දායී ලක්‍ෂණ දෙකම පවත්නා බව මෙයින් පැහැදිලි වේ. එනම් යාතු සහ ශාන්ති ගුණද්වයයි. බෝධිචර්යාවතාරයෙහි බෝසතුන් 'වජ්‍රින් ' නමින් හඳුන්වා තිබේ. ගුහ්‍ය සමාජ තන්ත්‍රයෙහි වජ්‍රය හඳුන්වා ඇත්තේ මෙසේය. දැඩි වූ හරවත් වූ , ඝන වූ, කැඩිය නොහැකි, බිඳිය නොහැකි, දැවිය නොහැකි විනාශ නොවන ලක්‍ෂණයන්ගෙන් යුක්ත ශූන්‍යතාව වජ්‍ර යයි. ගුප්ත විද්‍යා, මන්ත්‍ර මණ්ඩල, අභිචාර, යෝග ආදී කොටස් රාශියක් වජ්‍රයානයට ඇතුළත් වේ. අනුත්තර යෝගය සහ භාවනාව එහි ඇතුළාන්තයයි.

වජ්‍රයානයෙහි අභිචාර ක්‍රම 6ක් ඉගැන්වේ.

| | |
|---|---|
| මාරණ | (Killing) |
| මොහන | (enchanting) |
| ස්තම්භන | (paralyzing) |
| විද්වේෂණ | (envying) |
| උච්ජාටන | (exiting) |
| වශීකරණ | (subordinating) |

වජ්‍ර යානය බාහිරව බලනවිට විජ්ජා, රහස් ධර්ම, ශෘංගාර අභිනය, මන්ත්‍ර, මුද්‍රා, මණ්ඩල, යෝගවිධි ආදියෙන් සැදුම් ලත් ආගමික ක්‍රමයකි. අභ්‍යන්තර ස්වභාව විමසීමේ දී උත්කෘෂ්ට භාවනා මාර්ගයක් ලෙස අනාවරණය වේ. යථාපරිදි භාවනා සහ යෝග මාර්ගයෙහි යෙදීමෙන් විශ්ව ස්වභාව වන ශූන්‍යතාව අවබෝධ කෙරේ. යථාභූත ඥාන දර්ශනය ඉතා සියුම් සහ ගැඹුරු බැවින් එම ඥාන මාර්ගයට පිවිසීමේ ප්‍රාථමික පියවරක් ලෙස වන්දනා, පූජා, මන්ත්‍ර, මුද්‍රා ආදිය භාවිත කළ යුතුය. කෙසේ වෙතත් ගම්භීර ශූන්‍යතා දර්ශනය වෙනුවට සාමාන්‍ය අනුගාමිකයන් අතර බාහිර අභිචාර විධි වඩා ජනප්‍රිය වී ඇති බව සත්‍යයකි. කිසියම් ලෞකික සහනයක් එම ක්‍රම මගින් බැතිමතුන් අත්දකිනවා විය හැකිය.